

# සිංහල මහැදුරන් හදාළ යුතු නවකතාවක්




මේ කියන ලේඛකයා සරසවියකට ගිය වග අසා නැත. ඔහුගේ කත්තිලාව පුවත්පත ය - වටපිට සමාජය ය. ඒ දෙකෙන්ම පෝෂණය වූ අවසන් අවදියේ රාජ්‍ය සම්මාන ලබන නවකතාවක් ලිවීමට ද සමත් වූවෙකි. නමින් කසුරි ය. මුළු නම කරුණාදාස සූරියාරච්චි ය.

මා ඔහු ගැන කියන්නට පෙර මා මේ ලිපිය ලිවීමට හේතු වූ කරුණු පැහැදිලි කළ යුතුය. එකක් නොව කරුණු ගණනාවක් ඇත .

2005 දී විකුත් කරන ලද මගේ "සන්නිවේදන සංක්‍රාන්තිය" නම් ලිපි එකතුවට මම "සතිස්චන්ද්‍ර එදිරිසිංහට සන්දේශයක්" නමින් ලිපියක් ද ඇතුලත් කළෙමි. එය හිතාමතාම අරමුණු දෙකක් සිතේ තබාගෙන ලියූවකි.

ආසන්න අරමුණ වසර දොළහකට පසුව මා සිහිපත් වී මට ආරාධනාවක් කිරීමය. තමාගේ පොත් එළිදැක්වීමට එන්නට කියා. මා නොයාමට හේතුව මූලික වශයෙන්ම මා ඒ සෙප්පඩ විජ්ජාව අනුමත නොකරණ එකය. ඒ වචනය හරි නැති බව දනිමි. එහෙත් ඒ ක්‍රියාවගැන වඩා නම්බුකාර පදයක් මට නැත . මෙන්න හිටපු ගමන් පොත් 3 - 4 ක් ලියා ගෙන ඒ ටිකත් උස්සාගෙන මෙල්බර්න් නුවර ට ගොඩ බැහැලා මේ රටේ වාසය කරන හුදී ජනයාගේ පහන් සංවේගය උදෙසා ඒවා පිට කිරීමේ "කලා තෙළි මඩුවක්" නටන්නට සැරසෙනවාය. ඔය වාගේ කඩදාසිය ලිපේ දමලා මෙහාට දුවගෙන එන අයියලා කී දෙනෙක් නම් මෙරට ලියන ලද සිංහල පොත් එකක් වත් කියවා ඇද්ද? සිය අනුග්‍රාහක ගේබිකාවගේ පොත් ඇරුණුවිට එකක්වත් කියවනවා තබා දැකලාවත් ඇද්ද? මෙරට වාසය කරමින් පුලු පුලුවන් හැටියට පොත පත ලියා පළ කරන පනහකට පමණ ආසන්න ලේඛක ලේඛිකාවන් අතුරින් දෙදෙනෙකුගෙ නම් කියන්නට හැකිවේද? ඒ තරමට දැනුමක් තේරුමක් නැතිව අපට විජ්ජා පෙන්නීමට එන මේ කපටින්ට දිය යුතු ප්‍රතිචාරය සහ සංග්‍රහය හොඳටම දනිතත් මා 1960 දශකයේ පටන් හඳුනන මේ වියතාට ඒඑ ක සංග්‍රහයක් හෝ කිරීමට පසුබට වන්නෙමි.

ඒ ටික සැකෙවින් කියන අතර ඔහු මගේ පොදු පනිවුඩය ශ්‍රී ලාංකික සිංහල ලේඛකයන් වෙත රැගෙන යන වාහකයා ලෙසින් යොදා ගැනීම මගේ මූලික අරමුණ බව එහි ලා කෙළින්ම කියා ඇත .

මෙරට කුඹුරක් අද්දරින්ම පිහිටි කමතකට පය ගසා එහි තප්පලම් ගහගෙන පා ඉදිරියේ ඇති ලියැද්දට ඔබමින් ඇති වෙල් යාය හෝ එහි හතර මායිම් හෝ නොදැන ඒ කිසිවක් නොතකා සිය පම්පෝරිය කියා දීමට කැස කවා ගත් විශාරදයෝ ඉඳ හිට මෙරටට පාත්වන්නෝය. ඔවුනට පුද සත්කාර කිරීමෙන් යම් කිසි වාසි හදාගනු රිසි පුද්ගලයෝද සිටිති. මට ඒ කියන අසනීපය වැළඳී නැති වීම මගේ වාසනාවය. ඒ මගේ මියගිය පියණන්ගෙන් ලද උරුමයක් ය.

මා පොත පත ලියන්නේ - ලියා පළ කරන්නේ - එබඳු පටු චේතනාවකින් හෝ කිසිවකුගේ අණ පරිදි හෝ නොවේ.
මගේම චිත්ත ප්‍රීතිය උදෙසා ය. මගේම ආත්ම තෘප්තියටය.

මෙරට සිදුවන සිංහල සාහිත්‍ය මෙහෙවර - පොතපත - ගැන ශ්‍රී ලාංකික පාඨකයන්ට අදහසක් - අවබෝධයක් - දීමේ අරමුණින් මා වරක් මා ලියූ ලිපියක් (පහන සංස්කාරක ටියුඩර් අමරසේනගේ උපදෙස් මත) සිංහල පුවත්පතකට යැවුවෙමි. එය පත්තර කන්තෝරුවේ කුණු කූඩයට වැඩම කළ බව මට සිතා ගත හැකිය. මා ලියන ලිපි ඒ උත්තම සංග්‍රහටය පුරුදුව ඇත . මා ලියූ ලිපි කිහිපයක් එවක "මව්බිම" නකුවරයා වූ තිලකරත්න කුරුවිටබණ්ඩාර විසින් පළ කරන ලද බව කියන්නේ ඔහු විසින් මට පිරිනමන ලද "සිළුමිණ" සංග්‍රහය අමතක කරමිනි. ඒ අතුරින් එකක් (ලබ ධාතුවේ බල මහිමය) මා ලියූ "පිරිමි ජාතිය උතුම් ජාතිය" (2012) නම් ලිපි එකතුවට ඇතුළත් කර ඇත .

මගේ "සරළ සිංහල වියරණ විදි" (2013) ගැන පණ්ඩිත අශෝක කරුණාරත්න ලියූ විවේචනය මෙල්බර්න් ප්‍රකාශයක් වන "සන්නස" මාසිකයේ පළ වූ පසු එයම "සංස්කෘති" සඟරාවටද යැව්වෙමි. එය පළ වූ බව කෘතගුණ පූර්ණ ව සඳහන් කරමින්ම මම ඒ ප්‍රකාශකයන්ට දරුණු චෝදනාවක්ද නගන්නෙමි. මා ලියූ ලිපියක් (ලේඛිකාවන් කොන්කිරීම ගැන) ලැබුණු බව දන්වා ලිපියක් එවූ අමරදාස වීරසිංහ ඉන්පසු නිහඬවිය. පසුව මා මගේ "සිංගරු සිරිත" (2013) පොතට අයත් එක් පරිච්ඡේදයක් සුසිල් සිරිවර්ධන වෙත විද්‍යුත් ලිපි මගින් යැව්වද එය පළ කරපු පාටක් නැත . "කැන්ගරු දේශයේ සිංහල සාහිත්‍යය" යනුමෙන් ලියා ඇති ඒ ලිපිය කියවූවෙකුට තමන් නොදන්නා බොහෝ දේ මේ දූපතේ (මහ දූව) සිදුවන බව වැටහෙනු නොඅනුමානය. වරින් වර මෙරටට කඩාපාත්වන සාහිත්‍යධරයන්ද ඇත . ඒ කිසිවෙක් අපට දේශනාකිරීම හැරුණුවිට මෙරට සිදුවන කිසිම සාහිත්‍ය කාර්යයක් අධ්‍යයනය කිරීමට කල්පනා නොකරති.

මා අරමුණු කොටගත් නවකතාව ගැන කියන්නට මේ පසුතලය සුදුසුය. මගේ කතා නායකයා වූකලි 2001 සැප්තැම්බර් මාසයේ දිනක තකහනයක් දිවයින කන්තෝරුවට ගොසින් (එසේ කරන ලද්දේ කලින් දින රාත්‍රියේ දුරකතන ඇමතුමක් දී වෙලාව අසා ගෙනය.) පැයක් පමණ පොරොත්තු වී සිට දෝතින්ම පිළිගන්වන ලද පොත් 4 පිළිගෙන ඒ එකක් ගැන හෝ වචනයක් නොලියූ කසුරි ය. මුණු නමම කියතොත් කරුණාදාස සූරියාරච්චි ය. (ඒ දවස් වලට ඒ පොත් 4 ම කුරුවිටබණ්ඩාර - සිරි රණසිංහ (ලංකාදීප) වික්ටර් අයිවන් (රාවය) යන තුන් දෙනාටම දෝතින් පිළිගැන්වූ නමුත් පොත් පිළිබඳ වචනයක් පළ කරවීමට කිසිවෙක් උනන්දු නොවූහ. තුන් දෙනාම මා කලක් දැන සිටි පත්තරකාරයන්ය.

**මතු සම්බන්ධයි**

